# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 14,575 — 1965 දෙසැම්බර් 2 වැනි බ්‍රහස්පතින්ද — 2.12.1965

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත්‍ර ආඥාපණත

(420 වැනි අධිකාරය වන) ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත්‍ර ආඥපණතේ 34 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති, උක්තු බණ්ඩා වන්නිනායක වන මම, මෙයින්,

(1) 1958 නොවැම්බර් 21 වැනි දින හා අංක 11,590 දරන ගැසට් පත්‍රයෙහි පල කරනු ලැබූ 1958 නොවැම්බර් මස 17 වැනි දින දරන ආඥවෙන් ලබා ගැනීමට විධානය කරන ලද අවුරුදු 5–7 ණය මුදල ලබාගැනීම සඳහා ලංකාවේ දී නිකුත් කරන ලද ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු මේ ආඥපණතේ විධිවිධාන යටතේ නිකුත් කිරීමට ඇති වෙනත් ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු බවට පරිවර්තනය කළයුතු ලෙස ප්‍රකාශ කරමි ; තවද

(2) (1) වැනි ඡෙදයෙහි දක්වා ඇති ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු පරිවර්තනය කිරීම සඳහා මේ ආඥපණත යටතේ (මෙහි මින්මතු '' අළුත් ව්‍යාපාර වස්තු '' යනුවෙන් හඳුන්වනු ලබන) රු. 1,83,62,800ක ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු ඇති කිරීම සහ නිකුත් කිරීම සඳහා මීට අමුණා ඇති උප ලේඛනයෙහි නිශ්චිතව දක්වෙන නියමයන් හා කොන්දේසි අනුව බලය පවරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1965 නොවැම්බර් 29 වැනි දින,
කොළඹ දී ය.

### උප ලේඛනය

1. අළුත් ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ලබාගත යුතු මුදල රුපියල් එක්කෝටි අසූතුන්ලක්ෂ හැටදෙදහස් අටසියයක් පමණකි. එය සම මිලට නිකුත් කරන අවුරුදු 5–7½ ණය මුදලක් වශයෙන් ලබා ගත යුතුය.

2. ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු ඇතිකර, නිකුත් කිරීමෙන් පමණක් ණය මුදල ලබා ගත යුතුය.

3. ණය මුදල සඳහා ගෙවිය යුතු පොලිය වර්ෂයකට සියයට 3½ක් විය යුතුය.

4. ණය මුදල සඳහා අර්ධ වාර්ෂික පොලිය සෑම වර්ෂයකම ජූනි දහසය වැනි දින සහ දෙසැම්බර් දහසය වැනි දින ගෙවිය යුතුය.

5. අළුත් ව්‍යාපාර වස්තු නිදහස් කිරීමේ දිනය 1973 ජූනි දහසය වැනි දින විය යුතුය.

එසේ වුවද, 1970 දෙසැම්බර් මස පහළොස් වැනි දිනයට ඉක්බිති වූත්, හය මසකට නොඅඩු කාලයකට පෙර ගැසට් පත්‍රයෙහි පල කරනු ලබන නිවේදනයකින් ඇමතිවරයා විසින් නියම කරනු ලැබිය හැකිවූත්, යම් දිනයක, ඒ අළුත් ව්‍යාපාර වස්තු සම මිලට නිදහස් කිරීමේ කැමැත්ත රජයට තිබිය යුතුය.

### කාර්ය විස්තර පත්‍රිකාව

1965 දෙසැම්බර් 16 වැනි දින හැරවෙනු සඳහා ව්‍යාපාර වස්තුන් හැරවීමේ ලැයිස්තුව 1965 දෙසැම්බර් 6 වැනි දින විවෘත කොට 1965 දෙසැම්බර් 15 වැනි දින වසා දමනු ලැබේ. ඉතිරි නොහැර වූ කොටසක් වේ නම් ඒ සඳහා මුදලින් ණය ලබා ගැනීමේ ලැයිස්තුව 1965 දෙසැම්බර් 16 වැනි දින විවෘත කොට, එදිනම වසා දමනු ලැබේ.

### ලංකාණ්ඩුවේ හැරවීමේ ණය

#### ලබාගන්නා ණය ප්‍රමාණය රුපියල් 1,83,62,800—3½%, 1970–73 ණය මුදල

ලංකාණ්ඩුව වෙනුවෙන් පහත දක්වෙන ණය මුදල ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම ණය 1965 දෙසැම්බර් 16 වැනිදට ආපසු ගෙවීමට නියමිත, සියයට 2½, 1963–65 '' ආ '' කාණ්ඩයේ ලංකාණ්ඩුවේ ණයපත් සම මිලට හරවා දීමෙන් හෝ ඉතිරි නොහැර වූ කොටසක් වේ නම්, ඒ සඳහා මුදලින් හෝ භාර ගනු ලැබේ.

1973 ජූනි 16 වැනි දින ආපසු ගෙවනු ලබන සියයට 3½ ණය—එහෙත් මෙම ණය 1970 දෙසැම්බර් 15 වැනිදට පසුව හය මාසයක දැනුම් දීමකින් පසු ඕනෑම දිනයක ගෙවීමට ආණ්ඩුවට ඉඩ තිබේ.

ණය ලබාගැනීමේ බලය හා අරමුණ.—ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇප පත් ආඥ පනතේ (420 වැනි අධිකාරය) 34 වැනි වගන්තියේ විධිවිධාන යටතේ හා 1950 අංක 3 දරණ ජාතික සංවර්ධන ණය ආඥ පනතේ (409 වැනි අධිකාරය) බලයෙන්, 1958 දෙසැම්බර් මාසයේ දී ලබාගත් සියයට 2½, 1963–65 '' ආ '' කාණ්ඩයේ රු. 1,83,62,800 ණය මුදල හැරවීමෙන් මෙම ණය මුදල ලබා ගනු ලැබේ.

1683—ආර් 10663—6,750 (65/12)

**නිකුත් කරන පිළිවෙළ.**—ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ණය මුදල ලබා ගනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවෙහි රාජ්‍ය ණය අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු පිළිබඳව බලපවත්වන කොන්දේසි අඩංගු පත්‍රිකා ලබා ගත හැකිය).

**හැරවීම පිණිස ඉල්ලීම.**—1963–65, සියයට 2½ '' ආ '' කාණ්ඩයේ ණයපත් හිමියන් විසින් තමන් සතු ණයපත් මුළුමණින්ම හෝ කොටසක් හෝ 1965 දෙසැම්බර් 16 වැනි දිනයෙහි දී හැරවෙනු පිණිස 1970–73 සියයට 3½ නව ණය මුදලට සමාන නාමික ප්‍රමාණයකට ඉදිරිපත් කළ හැකිය. මෙසේ හැරවීමට කෙරෙන ඉල්ලීම් 1965 දෙසැම්බර් 15 වැනි ද දක්වා ඉදිරිපත් කළ හැකිය. මේ ඉල්ලීම් ඊට නියමිත පෝරමය සම්පූර්ණ කොට උචිත ව්‍යාපාර වස්තු සහතික ද සමග නොපමාව ඉදිරිපත් කළ යුතුය. අලුත් ව්‍යාපාර වස්තු සඳහා සම්පූර්ණ අර්ධ වාර්ෂික පොළිය 1966 ජූනි 16 වැනි දින ගෙවනු ලැබේ.

**මුදලින් ගෙවීමේ ඉල්ලුම් පත්.**—ව්‍යාපාර වස්තු හරවා දීමෙන් පසු 1963–65 සියයට 2½ '' ආ '' කාණ්ඩයේ ණය මුදලේ රු. 1,83,62,800න් ඉතිරි නොහැරවූ කොටසක් වේ නම් ඒ සඳහා මුදලින් ගෙවීමේ ඉල්ලුම් පත් 1965 දෙසැම්බර් 16 වැනි දින භාර ගනු ලැබේ. මුදලින් ගෙවීම සඳහා කෙරෙන ඉල්ලුම් පත් ඒ සඳහා නියමිත පෝර්ම සම්පූර්ණ කොට මුළු මුදල සමඟ එවිය යුතුය. ලංකා මුදල් ඉතිරිකිරීමේ බැංකුවේ සහ තැපැල් කන්තෝරු මුදල් ඉතිරි කිරීමේ බැංකුවේ මුදල් තැන්පත් කොට ඇති අයට මේ බැංකු මාර්ගයෙන් සිය ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකිය. '' ලංකාණ්ඩුවේ ණය අරමුදල '' යනුවෙන් හරස් ඉර්ඛිත කොට මහ බැංකුව වෙත ගෙවීමට අණකරන චෙක් පතකින් මුදල් ගෙවිය යුතුය. ප්‍රථම අර්ධ වාර්ෂික පොළිය ගෙවනු ලබන්නේ ඉල්ලුම් පත් පිළිගත් දින සිට 1966 ජූනි 15 වැනි ද දක්වා වූ කාල සීමාව සඳහා ය. ණය කොටසක මිල රුපියල් සියයට සියයකි. සම්පූර්ණ මුදල් ඉල්ලුම්පත් ඉදිරිපත් කරන විට ගෙවිය යුතුය. අඩුම කොටස රුපියල් සියයකි.

**තැරැව් ගාස්තු.**—බැංකුවලට ද (ලංකා මුදල් ඉතිරිකිරීමේ බැංකුව හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරිකිරීමේ බැංකුව ඇතුලු) පිළිගත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට හා අවසර ලත් තැරැව්කරුවන්ට ද, ඔවුන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම්පත් වෙනුවෙන් භාර ගත් නාමික ණය මුදල අනුව සියයට 1/16ක් කොමිස් වශයෙන් දෙනු ලැබේ. හුවමාරු ගාස්තු වශයෙන් නීතිඥවරුන්ට තමන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත්වල භාර ගත් ණය මුදලේ නාමික මිල සම්බන්ධයෙන් ඒ ප්‍රමාණයේ ම කොමිස් ගෙවනු ලැබේ.

**ව්‍යාපාර වස්තු කොටස් සහතික පත්‍ර.**—ඉල්ලුම් පත් ලැබීමෙන් හා පිළිගැනීමෙන් පසු ව්‍යාපාර වස්තු කොටස් සහතික නිකුත් කරනු ලැබේ.

**පොළිය.**—සෑම වර්ෂයකම අර්ධ වාර්ෂිකව ජූනි 16 වැනි ද හා දෙසැම්බර් 16 වැනි ද වර්ෂයකට සියයට 3½ බැගින් පොළී ගෙවනු ලැබේ.

**අයබදු ගැනීම.**—(i) මුද්දර ගාස්තු :—ණය නිකුත් කිරීම, පවරා දීම හා ආපසු ගෙවීමාදියේ දී පාවිච්චි කරන සෑම ලියවිල්ලක් ම මුද්දර ගාස්තුවලින් නිදහස් ය.

(ii) ආදායම් බදු :—ඒකාබද්ධ වූ හින්දු පවුල්වල සාමාජිකයින්ට හැර ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන්ට ආදායම් බදු අඩු නොකර පොළී ගෙවනු ලැබේ. නමුත්, ආදායම් බද්දට යටත්වන ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන් ආදායම් බදු සඳහා තමාගේ ආදායම් පෙන්වීමේ දී එම පොළිය ද අඩංගු කළ යුතුය. ලංකාවේ පදිංචි නොවූවන්ට හා ඒකාබද්ධ වූ හින්දු පවුල්වල සාමාජිකයින්ට පොළී ගෙවීමට පෙර ආදායම් බදු අඩු කර පොළී ගෙවනු ලැබේ. (දැනට ආදායම් බදු ප්‍රමාණය, ලංකාවේ පදිංචි නොවූ පුද්ගලයන්ගෙන් සියයට 33⅓ක් ද, ධනය ඒකාබද්ධ වූ හින්දු පවුල්වලින් සියයට 39⅓ක් ද, නිර්නේවාසික සමාගම්වලට ගෙවන ලද හෝ බැර කරන ලද, පොළිය සම්බන්ධයෙන් සියයට 67ක් ද වෙයි. ලංකා ආදායම් බද්දෙන් නිදහස් අයට, අය කරනු ලැබූ ආදායම් බදු එම දෙපාර්තමේන්තුවෙන් ආපසු ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ.

(iii) ධන බද්ද :—ලංකාණ්ඩුවේ සුරැකුම්පත්වල කරන ආයෝජනයන් 1963 අංක 4 දරන දේශීය ආදායම් බදු පනතේ 31 (1) (ජී) වගන්තිය යටතේ පුද්ගලයෙකුගේ ධනයට ඇතුළත් නො කැරෙන අතර ඒවා ධන බද්දෙන් ද නිදහස් වෙයි.

(iv) බූදල් බද්ද :—ලංකාණ්ඩුව විසින් ලංකාව ඇතුළත නිකුත් කරන ලද ව්‍යාපාර වස්තු බූදල් බදු ගෙවීම සඳහා ආණ්ඩුව විසින් භාර ගනු ලැබේ. සම්පූර්ණ මුදල ගෙවූ සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවන ව්‍යාපාර වස්තුන්ගේ නාමික මිලත්, එයින් රැස්වන පොළියත්, ඒ සමාන බූදල් බද්දක් ගෙවීමට යෙදිය හැකිය. සම්පූර්ණ මුදල නො ගෙවූ හෝ අඩු මිලට නිකුත් කළ හෝ සම මිලට නොව වෙනයම් මිලකට ආපසු ගෙවන හෝ ව්‍යාපාර වස්තුන් සඳහා රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකිනුත්, එයින් උපදින පොළියෙනුත් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය වරින් වර ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවේ. නමුත් එවැනි රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකින් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය, මුලින් ව්‍යාපාර වස්තුව නිකුත් කරන අවස්ථාවේ දී ගෙවූ මුදලත්, ව්‍යාපාර වස්තුව ආපසු ගෙවීමේ දී ගෙවෙන මුදලත් යන දෙක්හි අඩු මුදල යමක් වේ ද, එයට නො අඩු මුදලක් වේ. මුදලින් බූදල් බදු ගෙවීම වෙනුවට ව්‍යාපාර වස්තු මාර්ගයෙන් ගෙවීම කළ හැක්කේ එම ව්‍යාපාර වස්තුන් මුලින් නිකුත් කරන අවස්ථාවේ දී ම මියගිය තැනැත්තා විසින් මිලයට ගෙන තිබේ නම් හෝ මරණයට වසකට නො අඩු කාලයකට පෙර එම ව්‍යාපාර වස්තුන් මිලයට ගෙන තිබේ නම් හෝ පමණකි.

**ආණ්ඩුවේ ණය මුදලේ ප්‍රමාණය.**—දැනට ලංකාණ්ඩුවේ දළ සදතන ණය ප්‍රමාණය රු. 267,84,01,511 කි. ණය බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදල්හි ආසන්න වෙළෙඳ වටිනාකම රු. 41,84,28,365 කි. එම නිසා ආණ්ඩුවේ ඉතිරි ශුද්ධ ණය මුදල රු. 225,99,73,146 කි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන්, වාණිජ බැංකුවලින්, කච්චේරිවලින්, තැපැල් කාර්යාලවලින් හෝ ජාතික මුදල් ඉතිරිකිරීමේ ව්‍යාපාරයේ කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ද ලබා ගත හැකිය.

ඕ. බී. ගුණවර්ධන,
රාජ්‍ය ණය ලේඛකාධිකාරී තැන.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
ශ්‍රී ලංකා මහ බැංකු ගොඩනැගිල්ල,
තැ. පෙ. 1149, කොළඹ 1,
1965 දෙසැම්බර් 2 වැනි දින දී ය.

ලංකාවේ වැල්ලවත්තෙහි පිහිටි '' ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් '' හි නිපදවන ලද
කඩදාසිවල ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි